# ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමඟ හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?

දිවයින පුරා ශාඛා 272 කින් යුත් ජාලයකින් සහ 3000 කට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත විශිෂ්ඨ නායකත්ව හැකියාවකින් යුත් පළපුරුදු වෘත්තීයමය පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී

**ප්‍රධාන අවශ්‍යතා**

➢ පහත සඳහන් සුදුසුකම් අතුරින් අවම එක් සුදුසුකමක් ලබා තිබීම.
- (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක්

  හෝ
- (ආ) බැංකු හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක වෘත්තීය සුදුසුකම් ලබා තිබීම.

➢ බැංකුකරණය පිළිබඳ වසර 10 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබිය යුතුය.

➢ සංවර්ධන බැංකුකරණය, බැංකු මෙහෙයුම් කටයුතු, ණය අවදානම් කළමනාකරණය, බැංකු ව්‍යාපාර කටයුතු පිළිබඳ මූල්‍ය හා අලෙවිකරණ හැකියාවන් ලබා තිබිය යුතුය.

➢ විශිෂ්ඨ මානව සම්පත් කළමනාකරණය හා නායකත්ව කුසලතා සහිත විය යුතුය.

➢ වයස අවුරුදු 62 ට වඩා අඩු වීම.

## ප්‍රධාන අභ්‍යන්තර විගණක

**ප්‍රධාන අවශ්‍යතා**

➢ අවම වශයෙන් පහත සඳහන් එක් වෘත්තීමය ආයතනයක සාමාජිකත්වය ලබා තිබිය යුතුය.
- I. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
- II. එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය
- III. එක්සත් රාජධානියේ සහතිකලත් වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය
- IV. සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය එක්සත් රාජධානිය / ශ්‍රී ලංකාව හෝ වෙනත් සමාන වෘත්තීය සුදුසුකම්

➢ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (සහකාර සාමාන්‍යාධිකාරී) මට්ටමේ වසර 08 ක පළපුරුද්ද ලබා තිබිය යුතු අතර ඉන් වසර 05 ක් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව පළපුරුද්ද තිබිය යුතුය.

➢ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් විගණන ක්‍රමවේද පිළිබඳ මනා දැනුම හා පළපුරුද්ද තිබිය යුතුය.

➢ පිරිස් කළමනාකරණය සහ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අන්තර් ක්‍රියාකාරිත්වයන් පිළිබඳ තහවුරු කළ හැකි වාර්තා ඉදිරිපත් කළ යුතුය.

➢ බැංකු ක්ෂේත්‍රයේ ආයතනික යහපාලන භාවිතයන් සහ අනාවරණ අවශ්‍යතා පිළිබඳ දැනුම සහ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) භාවිතය පිළිබඳ දැනුම සහිත වීම.

➢ වයස අවු. 57 ට වඩා අඩු වීම සුදුසුය.

## සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

**ප්‍රධාන අවශ්‍යතා**

➢ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග CA/CIMA/ACCA වෘත්තීමය ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම.

➢ බැංකුකරණ / මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 12 ක පළපුරුද්ද සහිතව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (ප්‍රධාන කළමනාකරණ) මට්ටමේ අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.

➢ බැංකුකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

➢ අරමුදල් කළමනාකරණය / අවදානම් කළමනාකරණය / විගණනය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

➢ වයස අවු. 50 ට අඩු විය යුතුය.

## සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි

**ප්‍රධාන අවශ්‍යතා**

➢ පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමග අලෙවි ක්ෂේත්‍රයේ වෘත්තීමය සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම.

➢ බැංකුකරණය / මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 12 ක පළපුරුද්ද සහිතව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (ප්‍රධාන කළමනාකරණ) මට්ටමේ අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.

➢ බැංකුකරණය පිළිබඳ පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

➢ ප්‍රධාන සේවාදායකයන් සමග සමීප සහ සවිමත් සම්බන්ධතාවයක් ගොඩනැගීමේ හැකියාව නිරූපණය කළ යුතුය.

➢ අභිප්‍රේරණාත්මක දක්ෂතාව බහු කාර්ය හැකියාව සහ විශිෂ්ඨ සන්නිවේදනය, අන්තර් පුද්ගල සහ පුද්ගල කළමනාකරණ නිපුණතා අවශ්‍ය ගුණාංග වේ.

➢ සන්නාමකරණය, ඩිජිටල් අලෙවිකරණය සහ වෙළඳපල පර්යේෂණ පිළිබඳ පූර්ව පළපුරුද්ද අත්‍යාවශ්‍යයෙන් අපේක්ෂා කෙරේ.

➢ වයස අවු. 50 ට අඩු විය යුතුය.

## සහකාර සාමාන්‍යාධිකාරී - නීති

**ප්‍රධාන අවශ්‍යතා**

➢ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ධූරය දැරීම.

➢ නීති නිලධාරියෙකු ලෙස අවම වසර 12 ක සේවා පළපුරුද්දක් සහ ඉන් වසර 05 ක කළමනාකරණ පළපුරුද්දක් ලබා තිබීම. බැංකු හෝ මූල්‍ය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නීති නිලධාරියෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු සියලු නෛතික කටයුතු ආවරණය කිරීමේ පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

➢ මානව සම්පත් කළමනාකරණයට අදාළ සුදුසුකමක් ලබා තිබීම අමතර වාසියක් වනු ඇත.

➢ වයස අවු. 57 ට වඩා අඩු විය යුතුය.

### වැටුප් පරිමාව

තෝරාගන්නා ලද අයදුම්කරුවන් බැංකු ක්ෂේත්‍රයේ පවත්නා සම්මත, ආකර්ෂණීය දීමනාවන් සහිත වැටුපකට හිමිකම් කියනු ලබයි.

### අයදුම් කළ යුතු ආකාරය

ජීව දත්ත තොරතුරු ඇතුළත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විමසීම් තොරතුරු ද සහිතව විෂය (Subject) තීරයේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර, 2022 ජනවාරි 12 දින හෝ ඊට පෙර careers@rdb.lk විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන්න.


ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.
0112 42 52 62 | www.rdb.lk